# කුලියාපිටිය නගර සභාව

# කුරුණෑගල දිස්ත්‍රික්කය

--------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කුලියාපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

-----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී සහ ඉකුත් වර්ෂයේදී එකතුව රු.528,635 ක් වූ පුස්තකාල පොත් මිලදී ගැනීම් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) කුලියාපිටිය බස් නැවතුම්පලෙහි කඩකාමර 2 ක් සඳහා 2013 නොවැම්බර් සිට 2016 දෙසැම්බර් 31 දක්වා ලැබියයුතු රු.334,400 ක් වූ කඩ කුලී ගිණුම්ගත කර නොතිබුණි.

#### 1.3.2 නොසැසඳුනු පාලන ගිණුම්

---------------------------

ගිණුම් විෂයයන් 03 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් හා ඊට අදාළ උපයෝගී ලේඛනවල ශේෂයන් අතර රු.31,687,881 ක නොසැසඳීම් පැවතුණි.

**1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

**---------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ලැබියයුතු ගිණුම්

-------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.77,967,859 ක් වූ ලැබියයුතු ආදායම් ණයගැති ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවියයුතු ගිණුම්

-------------------

i. 2016 දෙසැම්බර් 31 දිනට වසර 03 ඉක්මවූ ආපසු ගෙවිය යුතු තැන්පත් රු.4,062,821 කින් නිරවුල් කළ හැකි ශේෂයන් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

ii. 2016 දෙසැම්බර් 31 දිනට වසර 03 ට වැඩි නිරවුල් නොකල ණයහිමි ශේෂය රු.3,776,729 ක් විය.

**1.3.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම**

**---------------------------------------------------------------------------**

පහත අනුකූල නොවන අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1646 | දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් නොකිරීම. |
| (ආ) <u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ</u> | |
| i. 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 හා 1994 අගෝස්තු 03 දිනැති අංක 26/92(1) චක්‍රලේඛය | වාහනවල ආයතනයේ නම හා රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබීම. |
| ii. 2013 අප්‍රේල් 22 දිනැති අංක 05/2013 චක්‍රලේඛය | රියදුරු හා කණිෂ්ඨ සේවකයින් 07 දෙනෙකුට එකතුව රු.28,000 ක නිල ඇඳුම් දීමනා ගෙවා තිබුණද, සේවකයින් නිල ඇඳුම්වලින් සැරසී රාජකාරියට වාර්තා නොකිරීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 56,548,493 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 23,770,479 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 32,778,014 ක වර්ධනයක් සිදු වී තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

පුනරාවර්තන ආදායම් රු.36,358,643 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

--------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රුපියල් මිලියන 71 ක් වූ අතර තථ්‍ය ආදායම රුපියල් මිලියන 45 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රුපියල් මිලියන 18 ක් වූ හිඟ ආදායම වර්ෂය අවසන් වන විට රුපියල් මිලියන 38 දක්වා වැඩි වී තිබුණි.

(ඇ) රු. 10,877,912 ක් වූ වර්ෂය සඳහා බිල් කරන ලද කුලී ආදායම්වලින් රු.8,731,763 ක් අය කරගෙන තිබුණි.

(ඈ) රු.25,559,220 ක් වූ වර්ෂය සඳහා බිල් කරන ලද වෙනත් ආදායම්වලින් රු.11,298,712 ක් අය කරගෙන තිබුණි.

**2.3.2 වරිපනම්**

----------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 වර්ෂයේ වූ තක්සේරුවෙන් පසු 2016 වර්ෂය අවසානය දක්වා අනුකූලතා සහතික නිකුත් කරන ලද නව ඉදිකිරීම් සඳහා තක්සේරු වටිනාකම ලබාගෙන වරිපනම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගැමා වෙළඳ සංකීර්ණයේ අනුකූලතා සහතික නිකුත් කරන ලද කඩ කාමර 84 කට 2016 වර්ෂයේදී තක්සේරු වටිනාකම් ලබාගෙන වරිපනම් අයකර නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට රු.8,285,262 ක් වූ වරිපනම් හිඟයෙන් රු. 2,115,892 ක් රජයේ දේපලවලින් අයවිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 කාර්ය සාධනය**

-----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඇස්තමේන්තු වටිනාකම රු.5,825,000 ක් වූ කර්මාන්ත 03 ක් ඉටුකර නොතිබුණි.

(ආ) සෞඛ්‍ය අංශයේ සැලැස්මේ සඳහන් වැඩ සටහන් 181 ක් ඉටුකර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටි ඉඩම සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-----------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කුලියාපිටිය පොදු වෙළඳපල කඩ කාමර 04 ක් ඉකුත් වර්ෂයේදී ලබාගෙන තිබුණු බදුකරුවන්ට එම වර්ෂයේ වූ මිල ගණන් මත සමාලෝචිත වර්ෂයටද බදු දී තිබීම තුළ තරඟකාරීත්වය මත සභාවට ආදායම් උපයා ගැනීමට තිබූ අවස්ථාව අහිමි කරගෙන තිබුණි.

(ආ) කුලියාපිටිය බස් නැවතුම්පලෙහි කඩ කාමර 02 ක් වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් 2013 වර්ෂයේ සිට කුලී ගෙවීමක් නොමැතිව පාවිච්චි කරමින් තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කුලිය රු.334,400 ක් විය.

**3.4 නිෂ්ක්‍රීය/ ඌණ උපයෝජිත වත්කම්**

-----------------------------------------

සභාව සතු වාහන 05 ක් අක්‍රීය තත්ත්වයට පත්ව තිබුණු අතර, සැලසුම් කළ වැඩ පිළිවෙලක් මත ඒවා ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.5 කොන්ත්‍රාත් පරිපාලනය**

--------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී රු.1,899,005 ක් වැයකර කොන්ක්‍රීට් කර සංවර්ධනය කර තිබුණු ඇස්සැද්දුම ගලහිටියාව මාර්ගයේ පාලම හා මාර්ගය සම්බන්ධ වන ස්ථානයේ මාර්ගය අඩි 45 ක් පමණ දුර ප්‍රමාණයක් කොන්ක්‍රීට් දමා නොතිබුණි. මාර්ගයේ පාලම ආසන්නයේ සිට පළමු මීටර් 30 පරීක්ෂා කිරීමේදී කොන්ක්‍රීට් තට්ටුවේ ස්ථාන 06 ක් මීටර් 1.3 සිට 10 දක්වා දිගින් පිපිරීම් සිදු වී තිබීම, තවත් මීටර් 30 ක් තුළ පිහිටි බෝක්කු කැට 4 ක් මත පිපිරීම් හා තවත් මීටර් 30 ක් ඇතුළත මාර්ගයේ වළවල් සෑදී තිබූ බව 2017 ජනවාරි 20 භෞතික පරීක්ෂාවේදී තහවුරු විය.

(ආ) කුලියාපිටිය සතිපොළ භූමියේ රු.938,870 ක් වැයකර කාර්යාල කාමර දෙකක් ඉදිකිරීමේදී නිම නොකළ වැඩ කොටස් වෙනුවෙන් රු.17,352 ක් සහ නිසි පරිදි සම්පූර්ණ නොකල වැඩ විෂයයන් 06 ක් වෙනුවෙන් රු.97,657 ක් ගෙවා තිබුණි.

**3.6 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

----------------------------------

කාබණික පොහොර නිෂ්පාදනය කිරීමට සුදුසු තත්ත්වයේ අට්ටි ගසන ලද විශාල කසල ප්‍රමාණයක් පැවතියද, කම්කරු හිඟය සහ කසල හලන යන්ත්‍රයක් ක්‍රියාවිරහිත වීම නිෂ්පාදන කටයුතුවලට බාධාවක් වී තිබුණි.

**3.7 පාරිසරික ගැටළු**

--------------------

ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ පිහිටි සෝගාතකාගාරය හා ඌරන් මරණ ස්ථානය ගරා වැටුණු ගොඩනැගිලිවල පවත්වාගෙන යමින් තිබූ අතර, යාබදව කුලියාපිටිය විශ්ව විද්‍යාලයේ නේවාසිකාගාරයක් හා ඇඟළුම් කම්හලක් පිහිටි භූමියක්ද පිහිටා තිබුණද, තාප්පයක් ඉදිකර මෙම ප්‍රදේශය වෙන්කර නොතිබුණි. තවද ඌරන් මරණ ස්ථානයේ අපද්‍රව්‍ය සහිත ජලය ගලා යාමට වලක් හෝ කාණුවක් ඉදිකර නොතිබුණු අතර පරීක්ෂණ අවස්ථාව වන විට ඝාතනය සඳහා ගෙන එන ලද ඌරන් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භූමිය අපවිත්‍ර කරමින් නිදැල්ලේ හැසිරෙන තත්ත්වයක් පැවතුණි. ඌරන්ගේ රෝම ඉවත් කිරීම සඳහා ගෙන එන ලද කැපුම් තල (බ්ලේඩ්) රාශියක් භූමිය පුරා විසිරී පැවතුණි.

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**--------------------------------------**

**4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

**------------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර ලේකම්වරයාගේ අවධානයට යොමු කරන ලද අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධතිය | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | තොග පාලනය | අවසන් තොගය, ලෙජර් අගයන් මත ගිණුම්ගත කර තිබුණු අතර, ගබඩා ලෙජර ශේෂ සමඟ රුපියල් මිලියන 23 ක වෙනසක් පැවතුණි. |
| (ආ) | ණයහිමියෝ | දීර්ඝ කාලීන ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | කොන්ත්‍රාත් පරිපාලනය | ඉදි කිරීම් නිසි ප්‍රමිතියෙන් තොරවීම.<br>ඉටු නොකළ වැඩ විෂයයන් වෙනුවෙන් ගෙවීම් කිරීම. |
| (ඈ) | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය | කාබණික පොහොර නිෂ්පාදනයේ අඩුවක් පැවතීම. |
| (ඉ) | පරිසර ගැටළු | අවට පරිසරය පිළිබඳව සැලකිලිමත් වීමකින් තොරව කටයුතු කර තිබීම. |